ද මැසිනොද් විදුහල, කඳාන
De Mazenod College, Kandana

ඉතිහාසය - I

පළමු වාර පරීක්ෂණය-2025 | 7 ශ්‍රේණිය | කාලය පැය 2

- සුදුසු පිළිතුර තෝරා ලියන්න.

1) ලෝකයේ පැරණිතම ගොවිතැන් ක්‍රමය ලෙස සැලකෙන්නේ,
   1. වී ගොවිතැන
   2. ධීවර කර් මාන්තය
   3. ලෝහ කර්මාන්තය
   4. හේන් ගොවිතැන

2) සාලිය කුමරා උපන් සමයේ හෙන්වල ඇති අස්වැන්න වැඩි වූ බව සඳහන් කරන මූලාශ්‍රයේ නම කුමක්ද ?
   1. සද්ධර් මාලංකාරය
   2. සී හලවත්ථු
   3. මහාවංශය
   4. තෝනිගල සෙල්ලිපිය

3) සෙල්ලිපි වල පිටබිම් ලෙස හැඳින්වුයේ,
   1. කුඹුරය
   2. හේනය
   3. වී බිස්සය
   4. වෙලදපොලවල්ය

4) ගිරි නම් ජනපදයේ සහෝදරයන් පස් දෙනෙකු උදු වැපිරීමට හේනක් සකස් කර ගැනීම පිළබඳ කතා පුවතක් සඳහන් වන මුලාශ්‍රය වන්නේ,
   1. මහා වංශයයි
   2. උම්මංග ජාතකයයි
   3. දීප වංශය
   4. සද්ධර් මාලංකාරයයි

5) වී පරිහරණයට ගන්නා තෙක් ආරක්ෂා සහිතව තැම්පත් කිරිම සඳහා භාවිතා කර ඇත්තේ,
   1. කමත
   2. කුඹුර
   3. හේන
   4. වී බිස්ස

6) වී වගාවේදි ගොයම් මැඩීම යනු,
   1. ගොයම් නෙලීම
   2. ගොයම් පැගීම
   3. ගොයම් වැපිරීම
   4. ගොයම් මේරීම

7) වාරි කර් මාන්තයට කල විශිෂ්ඨ සේවය නිසා මින්නේරි දෙවියන් ලෙස ප්‍රචලිත වූ රජතුමා කවුරුන්ද ?
   1. කාවන්තිස්ස
   2. දුටුගැමුණු
   3. මහසෙන්
   4. භාතිකාභය

8) සකපෝරුව භාවිතා කරන ලද්දේ මින් කුමන කර් මාන්තයක් සඳහාද ,
   1. ලෝහ කර් මාන්තය
   2. ජේෂ කර් මාන්තය
   3. උක් කර් මාන්තය
   4. මැටි කර් මාන්තය

9) ගම් වැව් යනු,
   1. වැව් පද්ධතියක් පවතින ගම්
   2. වැවක් පවතින ගම
   3. භාවිත නොකරන වැවක් ඇති ගම්
   4. වැව් දෙකක් පමණක් ඇති ගම්

10) ගෝපාල ගම් ලෙස හැඳින්වුයේ,
   1. මැටි කර් මාන්තයේ නියලෙන්නන් විසූ ගම්
   2. ධීවරයන් විසූ ගම්
   3. ගවයන් රැකබලා ගන්නන් විසූගම්
   4. ගොවිතැන් කරන්නන් විසූ ගම්

11) අත්තම් ක්‍රමය යනු,
1. භාණ්ඩයට භාණ්ඩයක් හුවමාරු කර ගැනීමේ ක්‍රමය
2. ශ්‍රමයට ශ්‍රමය හුවමාරු කර ගැනීමේ ක්‍රමය
3. සාමූහිකව කටයුතු කිරීමේ ක්‍රමය
4. තම කාර්යයන් තමා විසින් ඉටු කර ගැනීමේ ක්‍රමය

12) සූප ශාස්ත්‍රයෙන් දක්ෂ කාන්තාවන් හඳුන්වා ඇත්තේ,
1. මධුරාසා
2. මධුපානා
3. මධුරාසියා
4. මධුපාචිකා

13) අතීතයේ පැවති දොරමඩලා ග්‍රාමය
1. ගෝපාල ගමකි
2. පේෂාකාර ගමකි
3. කයිකාර ගමකි
4. කුම්බකාර ගමකි

14) මයිනහම උපයෝගී කරගෙන ඇත්තේ කුමන කර්මාන්තයක් සඳහාද,
1. රෙදි
2. මැටි
3. යකඩ
4. සපත්තු

15) ප්‍රවාහන කටයුතු සඳහා යොදාගත් ගවයන් හැඳින් වූ නම වන්නේ,
1. මී ගොන්
2. ගැල්ගොන්
3. ගොපලු ගොන්
4. හෝ ගොන්

16) අතීත සමාජයේ පැවති විවාහය පිළිබඳ නොගැලපෙන පිළිතුර වන්නේ,
1. දෙමාපියන් ආශිර්වාදය ලබා ගත යුතුය
2. සිරිත් විරිත් වලට මුල්තැන දිය යුතුය
3. පෙළපතට ගැලපෙන විවාහයක් කළ යුතුයු
4. තම කැමැත්තට මුල් තැන දී විවාහය කළ යුතුය

17) බදුලු ටැම් ලිපිය කරවන ලද රජතුමාගේ නම කුමක්ද ?
1. හතරවන උදය
2. පලවන සේන
3. පලවන කස්සප
4. පස්වන මිහිඳු

18) අතීතයේ පැවති වෙළඳ නගර ඓතිහාසික මූලාශ්‍රවල දක්වා ඇත්තේ
1. නිගම
2. පූග
3. පිටබිම
4. පටුන් ගම

19) මෙරට මූලාශ්‍ර වල සඳහන් වන පරිදි රුවන්වැලි සෑය අලංකාර කිරීමට රෝමයෙන් පබලු ගෙන්වාගත් රජතුමා වන්නේ,
1. දුටු ගැමුණු
2. භාතිකාභය
3. මහසෙන්
4. ධාතුසේන

20) මානවම්ම කුමරු ආරක්ෂාව පතා ඉන්දියාවේ කුමන රාජ්‍යයට පලා ගියේද ?
1. චෝල
2. පල්ලව
3. කේරල
4. පාන්ඩ්‍ය

## II කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතරු සපයන්න.

1)

i. පුරාණ ජීවන රටාව පැවති ප්‍රධාන ආකාර තුන කුමක්ද ?
ii. නවදැලි හේන හඳුන්වන්න.
iii. හේනක වගා කරන බෝග වර් ග 2ක් සඳහන් කරන්න.
iv. හේක ආරක්ෂා කිරීමට අනුගමනය කරන උපක්‍රම 3ක් ලියන්න
v. හේන් වගාව තුල ඇති විශේෂ ලක්ෂණයක් ලියන්න

2)

i. තෝනිගල ශිලා ලිපියට අනුව වී වගා කල කන්න තුන නම් කරන්න.
ii. වී වගා කරන ආකාරය කෙටියෙන් පහදන්න.
iii. ගොයම ආරක්ෂා කිරීමට ගොවියා භාවිතා කළ සාම්ප්‍රදායික ක්‍රම දෙක විස්තර කරන්න.
iv. මඩ ගොවිතැනට යොදා ගන්නා උපකරණ දෙකක් ලියන්න.
v. කැකුළු සහල් සාදා ගන්නේ කෙසේද ? පහදන්න.

3)

i. කිරි ලබාගත් ගව දෙනුන් හැඳින්වූයේ කිනම් නමකින්ද ?
ii. පස් ගෝ රස හඳුන්වන්න.
iii. අතීතයේ පැවති කර් මාන්ත 2ක් සඳහන් කර ඊට අදාල ශිල්පීන් නම් කරන්න.
iv. අතීතයේ මෙරට පැවති වෙලදාමේ ප්‍රදාන ආකාර 2 නම් කරන්න.

4)

i. මෙරට සිටි විදේශීය වෙලද ශ්‍රේණි 2 නම් කරන්න.
ii. ලංකාවේ භාවිත වූ මුල්ම කාසිය හඳුන්වන නම කුමක්ද ?
iii. එය සාදා ඇත්තේ කුමන ලෝහයෙන්ද ?
iv. එහි ඇති සංකේත මොනවාද ?
v. මෙරටට අතීතයේදී ආනයනය කල භාණ්ඩ 2ක් හා අපනයනය කල භාණ්ඩ 2ක් නම් කරන්න.
vi. ලංකාව වෙලද සබඳතා පැවැත්වූ රටවල් 2ක් ලියන්න.

5)

i. ලංකාවේ පැවති පැරණි ස්වභාවික වරායන් 2ක් නම් කරන්න.
ii. බදුලු ටැම් ලිපියේ අඩංගු වෙළඳපල නීති දෙකක් ලියන්න.
iii. අතීත ජන සමාජයේ වර්තමාන සමාජයට ගත හැකි ආදර් ශ 2ක් ලියන්න.
iv. අනුරාධපුර යුගයේ වැඩි කාලයක් මෙරට පාලනය කළ රජ පෙළපත් දෙක කුමක්ද ?
v. මානවම්ම රජුගේ පියා කවුරුන්ද ?
vi. මානවම්ම රජුගෙන් ගත හැකි ආදර් ශ 2ක් ලියන්න.